## ශීර්ෂය189 - මහජන ආරක්ෂක අමාත්‍යාංශය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය - 189 මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව 2023 ජුනි 27 වැනි දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපළ පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ගිණුම් ගත කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2021 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සහ ඉදිකිරීම් කෙරීගෙන යන වැඩ ශේෂය රු.608,836,986 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු.670,873,053 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA-82 හි, ආරම්භක ශේෂය රු.62,036,067 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙහි සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය හා ඉකුත් වර්ෂයේ අවසාන ශේෂය අතර වෙනස රු.62,036,067 ක් වේ.මෙය විශේෂ කාර්ය බලකායේ පෙර වර්ෂවල ආරම්භ කරන ලද කෙරීගෙන යන ගොඩනැගිලි සහ ඉදිකිරීම් (WIP) වලට අදාළව 2022 වර්ෂයේ දි ලැබුණු බිල්පත් සඳහා සිදුකළ ගෙවීම් වන අතර එය CIGAS වැඩසටහන තුළට ඇතුළත් කරනු ලබන්නේ පළමු ගෙවීම සිදු කරන විට කරන ලද ප්‍රාග්ධනිත කරන ලද කේතය යටතේම එකතු කිරීමක් ලෙස වන අතර (Addition) එය CIGAS වැඩසටහනේ නව මිලදීගැනීමක් ලෙස සටහන් නොවන අතර ආරම්භක ශේෂයට එකතුවන බැවින් ආරම්භක ශේෂ වෙනස් වී ඇතිබව දක්වා තිබුණි. | පසුගිය වර්ෂයේ අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතුය. |
| (ii) 2021 දෙසැම්බර් 31 දිනට අනෙකුත් යන්ත්‍ර සහ උපකරණ ශේෂය රු.2,656,391,978 ක් වුව ද, 2022 ජනවාරි 01 දිනට එය රු.2,647,338,195 ක් ලෙස දැක්වීම හේතුවෙන් SA-82 හි ආරම්භක ශේෂය රු.9,053,783 ක් අඩුවෙන් දක්වා තිබුණි. එම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ස්ථාවර වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ අතර වෙනස රු.764,640 ක් 2021 වර්ෂයේ විශේෂ කාර්ය බලකායට මිලදීගත් විදුලි ජනක යන්ත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු මුදලින් කොටස් ගෙවූ පසු 2022 වර්ෂයේ ගෙවන ලද ඉතිරි මුදල වේ. එම විදුලි ජනක යන්ත්‍රය පෙර වර්ෂයේ වත්කම් කේතයක් යටතේ ප්‍රාග්ධනිත කර ඇති අතර 2022 වර්ෂයේ රු.764,640 ක මුදල එම කේතය යටතේම එකතු කර ඇත. (Addition) එම නිසා CIGAS වැඩසටහනේ එය නව මිලදීගැනීමක් ලෙස සටහන් නොවන අතර ආරම්භක ශේෂයට එකතු වේ.<br>රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබාගෙන ඉදිරියේදී එය නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කරන බව දක්වා තිබුණි. | පසුගිය වර්ෂයේ අවසන් ශේෂය සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ආ යුතුය. |

| | | |
|---|---|---|
| (iii) සමාලෝචිත වර්ෂයේ රු.202,982,036 ක මූලධන වත්කම් අත්පත් කරගෙන තිබුණ ද, එය රු.139,073,445 ක් ලෙස SA-82 හි මිලදී ගැනීම් යටතේ ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ වටිනාකම රු.63,908,591 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2103 හා 2102 වැය විෂයයන්ට අදාළව වර්ෂයේ මුළු මිලදීගැනීම ලෙස රු.129,891,191 ක දක්වා ඇති අතර මූල්‍ය නොවන වත්කම් ලෙස වත්කම් ප්‍රකාශනයේ දක්වා ඇත්තේ රු.129,126,550 ක වත්කමකි. එහි වෙනස රු.764,640 ක මුදලකි. එම මුදල 2021 වර්ෂයේ විශේෂ කාර්ය බලකායට මිලදීගත් විදුලි ජනක යන්ත්‍රයක් වෙනුවෙන් ගෙවිය යුතු මුදලින් කොටස් ගෙවා 2022 වර්ෂයේ ගෙවන ලද ඉතිරි මුදල වේ. එම විදුලි ජනක යන්ත්‍රය පෙර වර්ෂයේ වත්කම් කේතයක් යටතේ ප්‍රාග්ධනිත කර ඇති අතර 2022 වර්ෂයේ රු.764,640 ක මුදල එම කේතය යටතේම එකතු කර ඇත. (Addition) එම නිසා CIGAS වැඩසටහනේ එය නව මිලදී ගැනීමක් ලෙස සටහන් නොවන අතර ආරම්භක ශේෂයට එකතු වේ.<br>එසේම 2104 (ගොඩනැගිලි සහ ඉදිකිරීම්) වැය විෂයයට අදාළව 2022 වර්ෂයේ මිලදී ගැනීම් ලෙස රු.70,261,948 ක මුදල දක්වා ඇති අතර මූල්‍ය නොවන වත්කම් ලෙස වත්කම් ප්‍රකාශයේ දක්වා ඇත්තේ රු.7,118,001 කි. එම වැය විෂයයෙහි වියදම හා වත්කම අතර වෙනස රු.63,143,943 ක් වේ.විශේෂ කාර්ය බලකායේ පෙර වර්ෂවල ආරම්භ කරන ලද කෙරීගෙන යන ගොඩනැගිලි සහ ඉදිකිරීම් (WIP) වලට අදාළව 2022 වර්ෂයේ දී ලැබුණු බිල්පත් සඳහා සිදුකළ ගෙවීම් වන අතර, එය CIGAS වැඩසටහන තුළට ඇතුළත් කරනු ලබන්නේ පළමු ගෙවීම සිදුකරන විට කරන ලද ප්‍රාග්ධනිත කරන ලද කේතය යටතේම එකතු කිරිමක් ලෙස වන අතර, (Addition) එය CIGAS වැඩසටහනේ නව මිලදිගැනීමක් ලෙස සටහන් නොවන අතර ආරම්භක ශේෂයට එකතුවන බව සඳහන්කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාළ ප්‍රතිපාදන මගින් ලබාගත් වත්කම් අත්පත්කර ගැනීම් යටතේ දැක්විය යුතුය. |

**(ආ) විගණන සාක්ෂි නොවීම**

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් විගණන සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 අප්‍රේල් 28 දිනැති අංක 2277/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයට අනුව සිදු වූ අමාත්‍ය මණ්ඩල සංශෝධනය අනුව ප්‍රජා පොලිස් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යන් හා කර්තව්‍යයන් මෙන්ම ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශයට අයත් සියලු වත්කම් සහ වගකීම් ද මහජන ආරක්ෂක අමාත්‍යාංශය වෙත පවරා තිබුණි.මෙලෙස වත්කම් පැවරීමේ දී 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 අයවැය චක්‍රලේඛ ඡේද අංක 20,21,22 සහ 23 අනුව මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමේ කටයුතු කළ යුතු වුවත්, නිවැරදිව ගිණුම්ගත කිරීම් සිදු වූවාදැයි තහවුරු කරගැනීමට ප්‍රජා පොලිස් රාජ්‍ය අමාත්‍යාංශයට අයත් වැය ලෙජර, ස්ථාවර වත්කම් ලේඛනය සහ පැවරීමට අදාළ ජ'නල් සටහන් විගණනය සඳහා ඉදිරිපත් නොවුණි. | ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශයේ යටතේ පැවති සියලුම මූල්‍ය නොවන වත්කම් මහජන ආරක්ෂක අමාත්‍යාංශය විසින් පවරාගැනීමෙන් පසු වෙනත් ආයතන වෙත පවරා දෙන ලද වත්කම් සඳහා ලැබීම් නියෝග සියල්ල මේ වන විට ලැබී ඇති අතර, සිගාස් මෘදුකාංගය මගින් අදාළ වාර්තා කිරීම් කටයුතු ඉදිරියේදී සිදු කරනු ලබනබව දක්වා තිබුණි. | 2022 සැප්තැම්බර් 21 දිනැති අංක 06/2022 අයවැය චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතු වීම. |

**2 මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2022 අප්‍රේල් 26 දිනැති 03/2022 අංක දරන අයවැය චක්‍රලේඛයේ 3 (xvii) ඡේදය ප්‍රකාර වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇත්නම් ඒවා වර්ෂය අවසන්වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු වුවත්, වැය විෂයයන් 25 ක් සඳහා රු.91,000 සිට | ජාතික අයවැය ඇස්තැමේන්තුවෙන් ලද වාචික උපදෙස් මත සිව්වන කාර්තුවේ වියදම් හා ඉදිරියට ගෙන ආ බැරකම් පියවීම සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන වැය විෂයයන් සඳහා 2022.12.22 දින මු.රෙ.66 අනුමැතිය මගින් ප්‍රතිපාදන මාරු කරගැනීමට කටයුතු කරන ලද බව දක්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස්වලට අනුගතව කටයුතු කළ යුතු වේ. |

| | | |
|---|---|---|
| රු.92,600,000 දක්වා සියයට 22 සිට සියයට 3000 දක්වා පරාසයක ප්‍රතිපාදන මු.රෙ.66/69 මගින් මාරු කරගෙන තිබුණි. | | |
| (ආ)189-1-03-1701 පාඩු සහ කපා හැරීම් වැය විෂයය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් මුදල් වෙන් කරවාගෙන නොතිබුණ ද, මු.රෙ.66/69 යටතේ ලබාගත් රු.9,059,731 ක මුදලක් පාඩු සහ කපා හැරීම් වැය විෂයයට උපයෝගී කරගෙන තිබුණි. | 2022 අයවැය ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේදී, විශේෂ කාර්ය බලකායේ අනතුරට පත් රථ වෙනුවෙන් මු.රෙ.109 යටතේ රථ වාහන අලාභයන් කපාහැරීම සඳහා 189-1-3-0-1701 වැය විෂයය යටතේ වියදම් දැරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාගැනීම සඳහා අවශ්‍යතාවක් නොතිබුණු අතර එම අවශ්‍යතාව මතු වූයේ 2022 වර්ෂය තුළදී බව දක්වා තිබුණි. | වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී ඉදිරි අවශ්‍යතාවයන් පිළිබඳ සැළකිලිමත් විය යුතු වීම. |
| (ඇ) වැය විෂයයන් 08 ක් සඳහා මු.රෙ.66/69 ප්‍රතිපාදන මාරුකිරීම් යටතේ වෙනත් වැය විෂයයන්ගෙන් රු.41,866,000 ක ප්‍රතිපාදන මාරු කරගෙන තිබුණ ද, එම වැය විෂයයන් වලින් සියයට 65 සිට සියයට 958 අතර ප්‍රමාණයකින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | 2022 මූල්‍ය වර්ෂයේ කාර්තුමය වශයෙන් ප්‍රතිපාදන ලබාදීම සිදු වූ අතර පෙර කාර්තුවේ ප්‍රතිපාදන ඉතිරිවීම් තිබුණද, ඊළඟ කාර්තුව වෙත ප්‍රතිපාදන මාරු කිරීමේදී ඇතැම් අවස්ථාවන්වලදී ගැටළු මතු වූ අතර, එවැනි අවස්ථාවන්වලදී ඉතිරිවීම් අපේක්ෂිත වෙනත් වැය විෂයයන් මගින් මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කරගෙන ඇතිබව දක්වා තිබුණි. | උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව ප්‍රතිපාදන උපයෝජනය කළ යුතු වීම. |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) බැරකම් හා බැඳීම් ප්‍රකාශයට අනුව බැරකම් රු.219,957,091 ක් වුව ද, බැරකම් ඉක්මවා රු.2,937,860 ක් ගෙවා තිබුණි. | බැරකම් හා බැඳීම් සිගාස් යෙදුම වෙත උඩුගත කිරීම සඳහා ලබා දුන් අවසන් දිනය වූ 2023.01.20 තෙක් ගෙවීම් සඳහා ඉදිරිපත් වූ බිල්පත් බැරකම් හා බැඳීම් වාර්තාවේ දක්වා ඇති අතර, 2023.01.20 දිනෙන් පසුව ඉදිරිපත් වූ ඇතැම් බිල්පත් බැඳීම් හා බැරකම් වාර්තාවේ පෙන්නුම් කිරීමට නොහැකි වී ඇතිබව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශනයේ ඇමුණුම (iii) හි සියලුම බැරකම් අනාවරණය කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක අමප / 16/0738/703/033 දරන 2016 මැයි 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව එක්සත් ජාතීන්ගේ සාමසාධක රාජකාරී සඳහා විශේෂ කාර්ය බලකායේ සංග්‍රාමික බල ඇණියක් මාලි රාජ්‍ය තුළ ස්ථාපිත කිරීමට අවශ්‍ය අවි ආයුධ,සන්නද්ධ රථ,ප්‍රවර්ථන වාහන, සන්නිවේදන උපකරණ ඇතුළු අනෙකුත් උපකරණ මිලදීගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබුණු අතර සාම සාධක රාජකාරි සඳහා නිලධාරීන් යෙදවීම තුළින් විදේශ විනිමය උපයා ගැනීම, නිලධාරීන්ගේ නිපුණතා සංවර්ධනය ,ජාත්‍යන්තර අත්දැකීම් ලබාගැනීම, නිලධාරීන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම වැනි කරුණු අරමුණු කරගෙන ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි.නිලධාරීන් 160 දෙදෙනෙකු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය මගින් තෝරා ගැනීමෙන් අනතුරුව පුහුණුවීම් ද ලබාදී තිබුණු අතර මෙම ව්‍යාපෘතිය සඳහා 2022 දෙසැම්බර් 31 දිනට රු.1,779,848,358 ක් වැයකර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානවන විටත් සාමසාධක රාජකාරී සඳහා එක්වීමේ අරමුණු ඉටු වී නොතිබුණි. | අවස්ථා ගණනාවකදී රේඛීය අමාත්‍යාංශය වෙනස්වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු මූලික අදියරයන්හි දී ප්‍රමාද වීම හා, 2019 වර්ෂයේ ආරම්භ වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අවශ්‍ය මිලදී ගැනිම් නිසි පරිදි සිදු කිරීමට නොහැකි වීම මෙන්ම 2022 වර්ෂයේ ආර්ථික අර්බුදයත් සමග දැඩි ආනයනික සීමාවන් හේතුවෙන් ආනයනය කිරීමට පැවති වාහන,යුධ උපකරණ වැනි අත්‍යාවශ්‍ය භාණ්ඩ මිලදී ගැනිමේදී සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වීම හේතුව ලෙස දක්වා තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |
| (ආ) විශේෂ කාර්ය බලකාය වෙත පැවරෙන රාජකාරී සාර්ථකව ඉටු කිරීමට ප්‍රමාණවත් හා ශක්තිමත් සන්නිවේදන ජාලයක් 2017-2020 කාලපරිච්ඡේදය තුළ ස්ථාපිත කිරීමට සැලසුම් කර | දෝෂ තත්ත්වයක් හා අඩුපාඩු යම් කාල වකවානුවක් තුළ නිරාකරණය කරගැනීම සඳහා ගිවිසුමක් සකස්කර එම ගිවිසුම මෙම ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයනු ලබන | සැලසුම් කළ ආකාරයට අදාළ පද්ධති පිහිටුවීමට පියවරගත යුතු වීම. |

| | | |
|---|---|---|
| තිබුණු අතර මෙම ව්‍යාපෘතියේ මුළු වටිනාකම රු.195,582,818 ක් විය. ව්‍යාපෘතිය වෙනුවෙන් 2018 වර්ෂය අවසන් වනවිට160,366,208 ක් වැයකර තිබුණ ද, 2022 වර්ෂය අවසන් වන විටත් මෙම ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන් අවසන් වී නොතිබීම මත අපේක්ෂිත ශක්තිමත් සන්නිවේදන ජාලය බිහිකිරීමට විශේෂ කාර්ය බලකායට නොහැකි වී තිබුණි. | පාර්ශව වෙත අනුමැතියට ඉදිරිපත් කර ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු සිදු කරන බව දක්වා තිබුණි. | |

## 3.2 වත්කම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) එක්සත් ජාතීන්ගේ සාමසාධක ව්‍යාපෘතියේ රාජකාරී සඳහා රැගෙන යාමට 2017 වර්ෂයේ සිට මේ දක්වා වාහන 42 ක් මිලදී ගෙන කටුකුරුන්ද, හොරණ සහ ගෝනහේන යන විශේෂ කාර්ය බලකා කඳවුරු තුළ ස්ථානගත කර නඩත්තු කටයුතු සිදු කරමින් පවතින අතර, කටුකුරුන්ද පුහුණු පාසල තුළ මෙම රාජකාරී සඳහා රැගෙන යාමට මිලදීගෙන ඇති අනෙකුත් භාණ්ඩ හා උපකරණ ගබඩා කර නඩත්තු කර පවත්වාගෙන යනු ලබයි. මෙම මිලදීගැනීම් සඳහා මේ වන විට රු. මිලියන 1780 ක් පමණ වැය කර තිබූ අතර, මෙසේ මිලදීගන්නා ලද වාහන ඇතුලු අනෙකුත් උපකරණ අවුරුදු 01 ත් 05 ත් අතර කාලයක සිට නඩත්තු කරමින් නිෂ්කාර්යව පැවතීම සහ එම භාණ්ඩවලට අදාළව ලබා දී ඇති වගකීම් කාලය උපයෝජනයකින් තොරව ඉකුත්වීම හා උපකරණ නිෂ්ක්‍රියව පැවතීමෙන් සිදුවන හානි පිළිබඳව වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි. | 2019 වර්ෂයේ ආරම්භ වූ කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් අවශ්‍ය මිලදී ගැනිම් නිසි පරිදි සිදු කිරිමට නොහැකි විම,<br>අවස්ථා ගණනාවකදී රේඛීය අමාත්‍යාංශය වෙනස්වීම හේතුවෙන් ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු මූලික අදියරයන්හි දී ප්‍රමාද වීමට සැලකිය යුතු බලපෑමක් ඇති වීම,<br>2022 වර්ෂයේ ආර්ථික අර්බුදයත් සමග දැඩි ආනයනික සීමාවන් හේතුවෙන් ආනයනය කිරීමට පැවති වාහන,යුධ උපකරණ වැනි අත්‍යාවශය භාණ්ඩ මිලදී ගැනිමේදී සැලකිය යුතු ප්‍රමාදයක් සිදු වීම හේතු ලෙස දක්වා තිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) විශේෂ කාර්ය බලකායෙහි පවතින ඉඩම් 19 ක් සමාලෝචිත වර්ෂය තුළ ද පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | විශේෂ කාර්ය බලකාය වෙත යම් ඉඩමක් පවරා දෙන තෙක් තක්සේරු කිරීමේ හැකියාවක් නොපවතී. එබැවින් ගිණුම්ගත කිරීම සිදුකළ නොහැකි වීම.විගණන විමසුමේ දක්වා ඇති ඉඩම් 19 න් 03 ක් මේ වන විට පැවරීම් කටයුතු අවසන්කර ඇති අතර තක්සේරු වාර්තා ලබා ගැනීමට නියමිතව ඇතිබව දක්වා තිබුණි. | ඉඩම් පවරාගෙන ගිණුම්ගත කිරීමට කඩිනම් පියවරගත යුතු වීම. |
| (ඇ) වාකරේ, වාලච්චේන ඉඩම් සහ ගොඩනැගිලිවල තක්සේරු වටිනාකම් තවදුරටත් ලබාගෙන නොතිබුණි. | වාකරේ හා වාලච්චේන කදවුරට අදාළ තක්සේරු කිරීම් සම්බන්ධයෙන් වාර්තා ඊට අදාළ අම්පාර තක්සේරු කාර්යාලය වෙත 2022.12.15 යොමුකර ඇත. තක්සේරු වාර්තා ලැබීමෙන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වත්කම්වල තක්සේරු වටිනාකම ලබාගැනීමට කඩිනම් පියවරගත යුතු වීම. |

**3.3 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ආබාධිත නිලධාරීන් විශ්‍රාම යෑම, සේවයෙන් ඉවත් කිරීම සහ සේවය හැර යාම යනා දී හේතුන් මත දැනට සේවයේ නොමැති නිලධාරීන් හා සේවකයන්ගෙන් 2022 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු වර්ෂ 05 ට වඩා වැඩි ණයශේෂ එකතුව රු.379,850 ක් විය. | 2022.12.31 දිනට රු.218,187 වූ හිඟ හිටි ණය මුදලක් අයකර ගැනීම සඳහා දිසා අධිකරණය යටතේ නඩු අංක 2285/20/BMR යටතේ නඩු පවරා ඇති අතර, ඊළඟ නඩු දිනය 2023.07.17 දිනට යෙදී තිබුණු බව දක්වා තිබුණි. | හිඟ හිටි ණයශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**4. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (i) අමාත්‍යාංශයේ ද්විතීක මට්ටමේ කළමනාකරණ සේවා නිලධාරී තනතුරෙහි නිලධාරීන් 18 ක් පුරප්පාඩු පැවතුන අතර සංවර්ධන නිලධාරී තනතුරෙහි | පුරප්පාඩුව ඇති තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතත්, ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතත් හා රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, | පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කිරීම හා අනුමත තනතුරු සංඛ්‍යා සංශෝධනය කර ගැනීමට පියවර ගත යුතු වීම. |

| | | |
|---|---|---|
| නිලධාරීන් 15 ක් අතිරික්තව පැවැතුණි. | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම් වෙතත් ලිපි යොමුකර ඇතිබව දක්වා තිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2022.04.28 දිනැති අංක 2257/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශය මෙම අමාත්‍යාංශය වෙත පවරා ඇත. ඒ අනුව ප්‍රජා පොලිස් සේවා රාජ්‍ය අමාත්‍යාංශයෙන් සංවර්ධන නිලධාරීන් 14 දෙනෙකු මෙම අමාත්‍යාංශයට අනුයුක්ත වු බව දක්වා තිබුණි. | |
| (ii) 2018 ජනවාරි 24 දින අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන්ව ඇති ඇමුණුම් 02 හි ආකෘතිය පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ මානව සම්පත් සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | 2020,2021 වර්ෂවල කොවිඩ් 19 තත්ත්වය හේතුවෙන් කාර්යය මණ්ඩලයේ පැමිණීම සීමා වීම හේතුවෙන් මානව සම්පත් සැළැස්මක් පිළියෙල කිරීම ප්‍රමාද වූ බව දක්වා තිබුණි. | 2018 ජනවාරි 24 දින අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලස්මක් පිළියෙල කළ යුතු වීම. |
| (iii)විශේෂ කාර්ය බලකායේ නිල ඇදුම් කාර්ය මණ්ඩලයේ අනුමත සංඛ්‍යාව 10743 ක් වුව ද, පුරප්පාඩු 3191 ක් පැවතුන අතර, එය සියයට 30 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | ආධුනික පොලිස් කොස්තාපල්වරුන් 300 දෙනෙකු 2022.04.20 දින කටුකුරුන්ද පුහුණු පාසල වෙත බඳවාගැනීමට කැඳවීම් ලිපි යොමුකර තිබූ අතර, රට තුළ පවතින ආර්ථික අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් පවත්නා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා අතිරේක ප්‍රතිපාදන නොලැබීම මත බඳවාගැනීම් සීමාකිරීම හේතුවෙන් ආධුනික නිලධරයන් බඳවාගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇත. | පවතින පුරප්පාඩු පිරවීමට ප්‍රමාණවත් පියවරගත යුතු වීම. |
| (iv)විශේෂ කාර්ය බලකායේ කාන්තා ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලධාරීන් 03 දෙනෙකු ද, පොලිස් පරීක්ෂක නිලධාරීන් 76 දෙනෙකු ද, පොලිස් සැරයන් තනතුරේ නිලධාරීන් 40 දෙනෙකු ද, කාන්තා පොලිස් සැරයන් එක් අයකු ද සහ පොලිස් සැරයන් | අතිරික්තව පවතින පහත තනතුරු අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි 2018.12.31 දිනට සේවා කාලය පදනම්කර ගනිමින් පුරප්පාඩු නොසලකා එක් වරකට පමණක් ක්‍රියාත්මක වන පරදි දරන්නාට පුද්ගලික වන සේ කාලානුරූපී පදනම මත උසස්වීම් ලබාදීම හේතුවෙන් ඇති වූ තනතුරු වූ බව දක්වා තිබුණි. | පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| රියදුරු 36 දෙනෙක් ද අතිරික්තව සේවයේ යෙදී තිබුණි. | | |
| (v) විශේෂ කාර්ය බලකායේ සිවිල් කාර්ය මණ්ඩලයේ අනුමත සේවක සංඛ්‍යාව 709 ක් වුව ද, පුරප්පාඩු 180 ක් පැවතුන අතර එය සියයට 25 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. | විගණන විමසුමේ දක්වා ඇති සිවිල් කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු නිලධාරීන් වාර්ෂිකව විශ්‍රාම යාම හේතුවෙන් ඇති වී ඇති අතර, පුරප්පාඩු පුරවා ගැනීම සඳහා ඊට අදාළ දත්ත සිවිල් පරිපාලන අධ්‍යක්ෂ මගින් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම්දී ඇත.<br>එමෙන්ම ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ගේ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බඳවාගැනීමේ කටයුතු තාවකාලිකව අත්හිටුවා ඇති බැවින්, ඊට විකල්පයක් ලෙස බහුකාර්ය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් බහුකාර්ය සහායක සේවක මහතුන් 144 දෙනෙකු ලබාදෙන බවට දන්වා ඇති අතර, ඉන් 36 දෙනෙකු මේ වන විට විශේෂ කාර්ය බලකායේ සේවයේ නිරතව ඇති බව දක්වා තිබුණි. | පුරප්පාඩු පිරවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු වීම. |